# 2.48 ශ්‍රී ලංකාවේ පහතරට දහඅට සන්නිය ශාන්තිකර්මය ආශ්‍රිත ප්‍රාසාංගික කලා විධි පිළිබඳ සංඥාර්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්

සුමිත් සී. දිසානායක
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, කොළඹ.

## ABSTRACT

ශ්‍රී ලාංකික අනන්‍යතාව සනාථ කෙරෙන දෘශ්‍ය කලා සම්ප්‍රදායන් තිබේ. එය උඩරට, පහතරට හා සබරගමුව වශයෙන් සම්ප්‍රදාය තුනකට බෙදා ඇත. එම ත්‍රිවිධ සම්ප්‍රදායට ආවේනික වූ විවිධ ශාන්තිකර්ම හා යාතුකර්ම ඇතුලත් ජනකලා සම්ප්‍රදායක් ද අප සතුයි. උපතේ සිට මරණය දක්වා මිනිස් ජීවිතයේ විවිධ අවස්ථාවල එම ශාන්තිකර්ම හා යාතු කර්ම කිරීමට අපේ අය පුරුදුව සිටී. වගා කටයුතු හා අස්වනු නෙලීම මින් ප්‍රදාන තැනක් ගනී. පුද්ගල රෝගාතුර වන අවස්ථා සහ ගම්මාන වලට ඇති වෙතැ යි සිතන දුර්භික්ෂ භය නැති කර ගැනීම සඳහා ද අපේ අය ශාන්තිකර්ම හා යාතුකර්ම වලින් කිසියම් සහනයක් අපේක්ෂා කරයි.

මෙම ශාන්තිකර්ම හා යාතුකර්ම අපට ම ආවේනික ප්‍රබල සන්නිවේදන ක්‍රමයකි. එහිදී භාවිත කෙරුණු ඉඟි, මුහුණු, වර්ණ, ආභරණ, පසුතල, ආලෝකය, රංග භාණ්ඩ, ගායන, නර්තන හා වාදන රටා, සැරසිලි, සම්ප්‍රදායික අභිනය විධි මෙන් ම පිළිවෙත් මඟින් විවිධ සන්නිවේදන අරුථ සැපයීම ද විශේෂත්වයකි. මාගේ අධ්‍යයනයේදී ප්‍රමුඛව අවධානය යොමු කළේ පහතරට පැරණි ශාන්තිකර්මයක් වන ,සන්නියකුම, හෙවත් ,දහඅට සන්නිය, ශාන්තිකර්මයටයි.

පහතරට ශාන්තිකර්ම ක්‍රමවේදයේ සන්නිවේදන අර්ථ සකස් වූයේ කෙසේ ද? වර්තමාන රූපවාහිනී මාධ්‍ය සාහිත්‍ය පෝෂණය සඳහා සාම්ප්‍රදායික දෘශ්‍ය රූප ප්‍රාසාංගික ක්‍රමවේ ද යොදා ගත හැකිද යන්න විමසීමට ලක්කරන ලදී.

සන්නිවේදන අර්ථ විශ්ලේෂණ කිරීම සඳහා නූතන සන්නිවේදන පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස සංඥාර්ථ විද්‍යාත්මක ක්‍රමය භාවිත කළෙමි. නූතන දෘශ්‍ය කලාව සංඥාර්ථ විද්‍යාවට යටත්ය. එපමණක් නොව සෑම දෙයක් සංඥාර්ථ විද්‍යාත්මකව විග්‍රහ කළ හැකි ය යන්න එම විෂයෙහි පදනමය. සමස්ත දෘශ්‍ය මාධ්‍ය වැඩසටහන් සංඥාර්ථවේදී භාෂාවක් ලෙස සැලකේ.

| ශාන්තිකර්මයේ විශේෂිත අංග | භාවිත ආකාරය | සන්නිවේදන අර්ථ |
|---|---|---|
| 1. ඉඟි | යකදුරන්ගේ යකුන් සමඟ, යකුන් බෙරකරු සමඟ අදහස් හුවමාරු කර ගැනීම | පුද්ගලාන්තර සන්නිවේදන ලක්ෂණ විදහා දක්වයි. |
| 2. නර්තන රටා, බෙරපද හා ප්‍රාසාංගික රඟපෑම් | යකුන්ගේ හැසිරීම විලාසය කියාපායි. | පහතරට ගැමි සංස්කෘතියේ ප්‍රාසාංගික ලක්ෂණ ගැබ්ව ඇත. |
| 3. මුහුණු, ඇඳුම්, ආභරණ හා රංග භාණ්ඩ | යකුන්ගේ විවිධ විලාස දක්වේ. | ගැමි සංස්කෘතියේ සහ ජන දෘශ්‍ය රූප විදහා දක්වයි. |
| 4. දෙබස් | හාස්‍ය හා උපහාසය අරමුණු කොට ඉදිරිපත් කරයි. | ගැමි සමාජයේ යථාර්ථය සන්නිවේදනය කරයි. |
| 5. සැරසිලි | රඟ මඩල නිර්මාණය කිරීම | මෙම ශාන්තිකර්මයට අවශ්‍ය පසුබිම සකස් කිරීම. |

මෙම පර්යේෂණ ගම්‍යමාන වූයේ සාම්ප්‍රදායික කලා මාධ්‍ය ආශ්‍රිතව ලැබිය හැකි ආභාෂයන් වර්තමාන දෘශ්‍ය කලා මාධ්‍යයේ ප්‍රගමනයට හේතුවන බව ය, දහඅට සන්නියේදී භාවිත කෙරෙන සංඥා ,දෘශ්‍ය රූපය, පෝෂණයට යොදා ගත හැකිය යන්නයි. එමෙන්ම රූපවාහිනී ගීත කලාවේ දෘශ්‍ය රූපය නිර්මාණය සඳහා සාම්ප්‍රදායික ජන කලා හා පැරණි සාහිත්‍යයේ ආභාෂය ලබා ගත හැකි බවත් ය.